## බස්නාහිර පළාත් යෞවුන් ලේඛක තරඟාවලිය 2022-2023

### තරඟ විස්තර පත්‍රිකාව

බස්නාහිර පළාත් යෞවුන් ලේඛකයන් දිරි ගැන්වීමේ අරමුණ ඇතිව සාහිත්‍ය තරඟාවලියක් පැවැත්වීමට බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය සැලසුම් කර ඇත. මේ සඳහා බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි වයස අවුරුදු 16-35 අතර තරඟකරුවන්ට සහභාගී විය හැකිය. <u>සිංහල මාධ්‍යයෙන් පමණක්</u> තරඟ නිර්මාණ භාර ගනු ලැබේ.

- <u>විශේෂ සටහන 01 - : 2022 වසර බස්නාහිර පළාත් යෞවුන් ලේඛක තරඟාවලිය සඳහා නිර්මාණ භාර ගැනීම සිදු කළ ද තරඟය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවනු ලැබූ අතර, ඒ අනුව 2022 වර්ෂයේ යොමු කරන ලද නිර්මාණ ද 2023 වර්ෂයේ බස්නාහිර පළාත් යෞවුන් ලේඛක තරඟාවලිය සඳහා අදාල කර ගනු ලැබේ. ඒ අනුව 2022 වර්ෂයේ යම් තරඟ අංශයක් සඳහා නිර්මාණ යොමු කරන ලද නිර්මාණකරුවන් එම තරඟ අංශය සඳහාම 2023 වර්ෂයේ දී නැවත නිර්මාණ යොමු කරන්නේනම් එම නිර්මාණ ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>

<u>තරඟ අංකය හා තරඟ නාමය</u>

- තරඟ අංකය - 1
  යෞවුන් නවකතා තරඟය
  (වචන 20,000 - 25,000 අතර)

- තරඟ අංකය - 2
  යෞවුන් කෙටිකතා තරඟය
  (වචන 1000-1500 අතර)

- තරඟ අංකය - 3
  යෞවුන් පද්‍ය (නිසඳැස්) තරඟය
  (පේළි 40-60අතර)

- තරඟ අංකය - 4
  යෞවුන් පද්‍ය(සඳැස්) තරඟය
  (පේළි 40-60අතර)

- තරඟ අංකය - 5
  යෞවුන් ගී පද රචනා තරඟය
  (ගායනයට සුදුසු වචන සංඛ්‍යාවක්)

<u>විස්තර හා කොන්දේසි</u>

1. එක් තරඟකරුවකුට එක් තරඟ අංශයක් සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයක් පමණි. එහෙත් තරඟ එකකට වඩා වැඩි ගණනකට නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.( <u>විශේෂ සටහන 01 බලන්න)</u>

2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 16 - 35 අතර විය යුතුය. <u>වයස තහවුරු කිරීම සඳහා උප්පැන්න සහතිකයේ පිටපතක් හෝ හැඳුනුම්පතෙහි පිටපතක් තමා විසින්ම සහතික කර නිර්මාණය සමඟ යොමු කිරීම අනිවාර්ය වේ.</u>

3. සියලු නිර්මාණ ස්වතන්ත්‍ර විය යුතු අතර මොනම ආකාරයකින් හෝ වෙනත් නිර්මාණයකින් උපුටා ගත් හෝ අනුවර්තනය කර ගත් හෝ ඇසුරු කර ගත් නිර්මාණයක් නොවිය යුතුය. එසේම මෙයට පෙර කිසිදු

